

කොඩියගේ ලමේ

ලක්ෂ්මන් කොඩිතුවක්කු

# ආදරය පළමුව



ඕස්ට්‍රේලියාවේ සමරිසි අයිතීන් වෙනුවෙන් ඔවුන් කාලයක් තිස්සේ ඉල්ලා සිටි නීතිමය ගැටළුව විසඳුනේ ජනමතයකිනි. එය අවසන් වූයේ සියයට හැට එකක පමණ ප්‍රතිශතයකින් ඔවුහු ජයග්‍රාහකයන් බවට පත් කරමිනි. එහෙත් නීතිමය පැත්තෙන් බාධා තිබුණද සමරිසියන් එකිනෙකට ආදරය කරමින් කාලයක් පුරා මෙරට තුළ ජීවත් වූයේ බොහෝ නිදහසෙනි. නීතියෙන් අත්සන් නොකළද ඔවුහු කසාද බැඳ විවාහ උත්සව පැවැත්වූහ. පවුලක් වශයෙන් ජීවත් වූහ. පෙර අඹුසැමි විවාහවලින් ඔවුනට උපන් දරුවන්ද හදාවඩා ගනිමින් ජීවත්වෙන සමරිසියන්, මෙරට තුළ නීතියෙන් අත්සන් නොකොට එකට ජීවත් වූයේ කාලයක් පුරාය. කිසිවෙකුත් ඔවුහු පහත් ලෙස සළකා සමාජයෙන් කොන් කළේ නැත. පොන්නයා, කොලු කාරයා, ආප්පී ආදී ගැරහුම් වචනවලින් ඔවුහු හැඳින්වූයේද නැත. ඡන්දය හිමි ජනයාගේ බහුතරය ඔවුන්ගේ නීතිමය අයිතීන් පිළිගත්තේ විරුද්ද ලිංගිකයන් සේම සමලිංගිකයන්ද පුරුෂයන් බිහිවේ. පුරුෂයන් මෙන් පෙනුමැති ස්ත්‍රීන් බිහිවේ. මේ කිසිවක් නැතත් සමරිසි ආශාවන් ඇති මිනිසුන් ද ගැහැණුන්ද අප අතර ජීවත් වේ. සමරිසියන් ද මනුෂ්‍යයෝ ය. එහෙයින් ලිංගිකත්වය, ආදරය, ආශාව, මිනුම් දඬු නැත. නීතිවලින් බැම්මවලින් සිරකර තබාගත නොහැක.

ඕස්ට්‍රේලියාව බහුවාර්ගික රටකි. නොයෙක් රටවලින් සංක්‍රමණය වූ පිරිස් ජීවත්වෙන මෙරට තුල ඔවුන් ලැබූ මේ ජයග්‍රහණය

මේ මහ පොළොවේ එකිනෙකාට ආදරය කරමින් ජීවත් වූවාට කිසිඳු වරදක් නොමැති බව ඔප්පු කරමිනි. ආදරයට සීමා මායිම් නැත. ලිංග භේද නැත. නීති හදන්නේද මිනිසුන්ය. නීති කඩන්නේද මිනිසුන්ය. නීතියක්. සදාචාරයක් නොතිබූ යුගවලදී පවා

**සමරිසියන් හා සංක්‍රාන්තික ලිංගිකයන් අප වැනිම හැඟීම්, දැනීම ඇති අයිතිවාසිකම් හිමි පිරිසක් බව මා වැනි පුද්ගලයෙකුට පවා අවබෝධ වූයේ මෙවැනි රටක බහුවාර්ගිකයන් හා ගැටෙමින් ජීවත් වූ බැවිනි.**

සමරිසියන් ජීවත් වූ බවට ඕනෑතරම් සාධක හමු වී තිබේ. ඒ වෙනුවෙන් මරණය හිමි වූ මිනිසුන්ද මේ මහ පොළොවේ ඕනෑතරම් ඇත.

මේ ලෝකයට මනුෂ්‍යයෙක් වශයෙන් බිහිවන සියල්ලෝම යම්කිසි ලිංගයක් ඇතුව උත්පත්තිය ලබයි. ස්වභාව ධර්මයා විසින් විරුද්ධ ලිංගයන් සහිතව සතුන් මෙලොවට බිහිකර ඇත්තේ මේ වර්ගයා වෙන් කර ගැනීමටය. ලෝකයේ ඉදිරි ගමනේ රැඳ පැවැත්මටය. එහෙත් ශරීරයේ ජාන හා හෝමෝන වෙනස්කම් අනුව ස්ත්‍රී පෙනුමැති

මනුෂ්‍යත්වයට පිදෙන මල් මිටකි. එහෙත් නොයෙක් රටවලින් සංක්‍රමණය වූ බොහෝ ආගමික නායකයන් මෙම තීරණයට තවමත් විරුද්ධව තම මතය ගොඩ නැගුවද, එයින් සමරිසි අයිතීන්ට කිසිඳු හානියක් සිදු නොවන බව අපට විශ්වාසය. මෙරට තරුණ තරුණියන් බහුතරයකට ආගම් නැත. ජාතියක් ද නැත. ඔවුන්ට සම කළු ද, සුදු ද, දුඹුරු ද කියාද ප්‍රශ්ණයක් නැත. සියල්ලෝම ඕස්ට්‍රේලියානුවොය. පන්සල් පල්ලි කෝවිල් තිබුණද ඒ තුළ වන්දනා කරන බහුතර පිරිස මැදි වයසේ හා වයස්ගත සංක්‍රමණිකයෝය.

භූමි මහේන්ද්‍රන් ජීවත්වන්නේ ශ්‍රී ලංකාවේය. ඇස සංක්‍රාන්ති ලිංගික අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නඟන ලිංගිකත්වය වෙනස් කරගත් ගැහැණියකි. ඇයගේ අතීත කතාව අනුවේදනීයය. ලංකාවේ සංක්‍රාන්ති ලිංගිකයන් ලිංගික වහලුන්ය. උසුළු විසුළුවලට ලක්වන අමුතුම සත්ව කොට්ඨාෂයකි. මෑතකදී ඇය පුවත් පතකට පවසා තිබුණේ බොහෝ පිරිමින් තමාගෙන් වුවද බලාපොරොත්තු වූයේ ආං පමණක්ම බවය. කොළඹ නගරයේ මුඩුක්කු ආශ්‍රිතව තවමත් පපර බෑන්ඩ්වලට නටවන්නේ ඔවුන්ය. දේශපාලන පෙළපාලිවලටද නටවන්නේ ඔවුන්ය. පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරු ඇමතිවරු එකිනෙකාට අපහාස කරගන්නේද පොන්නයා කියමිනි. සංක්‍රාන්ති ලිංගිකයන් එවැනි සමච්චලයට භාජනය කරන උත්තරීතර යැයි කියා ගන්නා පාර්ලිමේන්තුවක් තුළින් සමරිසි හා සංක්‍රාන්තික ලිංගික අයිතිවාසිකම් දිනාගැනීම විහිළුවක් බව ඇය පවසා තිබුණි. එය සත්‍යයකි. අප රටේ එවැනි අයිතිවාසිකම් වෙනුවෙන් කවුරුන් හෝ පෙරමුණ ගතහොත් ඊට මුලින්ම විරුද්ධ වන්නේ කෝවිල්, පන්සල්, පල්ලි වල විරාජමානව වැඩ සිටින ආගමික නායකයන්ය. එහෙත් ඔවුන් තුලද සමරිසියන් සිටින බව අප අමතක කළ යුතු නොවේ.

සමරිසියන් හා සංක්‍රාන්තික ලිංගිකයන් අප වැනිම හැඟීම්, දැනීම ඇති අයිතිවාසිකම් හිමි පිරිසක් බව මා වැනි පුද්ගලයෙකුට පවා අවබෝධ වූයේ මෙවැනි රටක බහුවාර්ගිකයන් හා ගැටෙමින් ජීවත් වූ බැවිනි. අප මෙරටට සංක්‍රමණය වූයේ, අප රටේ සංස්කෘතික හා සාරධර්ම බොහෝමයක් කර පින්නාගෙනය. එහෙත් අප දරුවන් ලොකු මහත්වන විට ඒවායින් බොහෝමයක් අපට පොළොවට විසිකොට අවසන් ගමන් යාමට සිදුවේ. ඒවා නිසි ලෙසකි න්වත් කාටවත් වෙනස් කළ නොහැක.

මීට වසර විස්සකට පමණ ඉහතදී, අපි අපේම සාරධර්ම කරපින්නාගෙන සිටින අවධියකදී මා අතින් නිසඳැසක් ලියැවිනි. ඒ එවැනි අවදියකදී චැනල් 9 රූපවාහිනිය තුලින් සජීවීව පෙන්නු වාඩ් ග්‍රා පෙරහැර පිළිබඳවයි. ඒ ආශ්‍රිතව මගේ පෑනින් ලියවුණු එය මෙසේය. මුහුකුරා ගිය මා අතින් මැදිවියේදී ලියවුණු මේ පිළිබඳව මගේ සිතුවිලි වෙනස් වීම ගැන මම සතුටු වෙමි.

නාඩන්න සුදු දුවේ - වැහුවාට පොඩි තිරේ
අලි ඇතුන් කළු නැටුම් පෙර වායො ගිනි රවුම්
මහ බඹා ගී ගැයුම් කොහොඹ කවඩි නැටුම්
මා ඔබට කියාදුන් පෙරහැරක් නොවේ දුව
ඔය යන්නේ නිරුවතින් මහ පාරේ

උඩරටයි පහතරට බෙරහඬද වන්නම්ද
නිලමෙලා ඉදිරිපස තේජසින් පා තැබූ
කරඬුවක් පිට තබා ඇත් රජ ගමන් කළ
පින් කරපු නෙත්වලට පමණක්ම දැකිය  හැකි
පෙරහැරක් ගැනයි මං කියා දුන්නේ දුවට

පයෝධර පිරි පිරිමින් මස්පිඬු ලෙලවන ගැහැණුන්
විළිවසා ගත් අශ්ව පිටේ නිරුවත් මනු සතුන්
නටනා රිද්මය සුණු විසුණු කර
නොමැති ඉඟ සුග නලවා මස් ගොබ සොලවා
දියුණු යැයි ලෝතලේ හඬ නඟන නොමිනිසුන්
සොබා දහමට එරෙහිවද වල්මත්ව ගලායන
අසම්මත පෙරහැරක් දුවේ ඔය දිලිසෙන්නේ
ඔබට හිමි පොඩි තිරේ

මහ බඹුන් අලි ඇතුන් මඟ එන්නේ යැයි සිතා නෙත් අයා
නොබලන්න නාඩන්න සුදු දුවේ වැහුවාට පොඩි තිරේ

මාගේ දැනීම පරිදි, බොහෝ ප්‍රේක්ෂකයන්ගේ විරුද්ධත්වය නිසා මෙම පෙරහැර දැන් සජීවීව විකාශය වන්නේ නැත. එහෙයින් මේ සමහර අදහස්වලට තවමත් වලංගුබාවයක් පවතී. එසේම ඒ දියණිය ද දැන් තුරුණුය. රූපවාහිනිය අසලදී ඇයගේ දෑස් බැඳ දැම්යද නොහැකිය. කාලයත් සමඟින් ඒ චිත්ත සන්තානය වෙනස් වී ඇත. ඒ සමඟම මාද දැන් සමලිංගිකයන්ගේ අයිතීන් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළ ඡන්ද දායකයකු බවට පත් වී ඇත.